**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

-----------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

--------------------------------------

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2011දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලං.ගි.ප්‍ර)

------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍යම කොටසක් වුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 හි අවශ්‍යතාවය පරිදි මෙම ප්‍රකාශනය කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි. තවද මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාව මගින්ද එය කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන ලදී.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 09 ප්‍රකාරව මූල්‍ය හා ආයෝජන කටයුතුවලින් වන මුදල් ප්‍රවාහය පැහැදිලිව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙනම දැක්විය යුතුය. කෙසේ වුවද මෙම කටයුතුවලින් වූ රු. 33,002,372,764 ක මුදල් ප්‍රවාහය වෙනම දක්වනු වෙනුවට ආයෝජන කටයුතු යටතේ දක්වා තිබුණි.

(ඇ) රු. 23,403,160 ක් වූ පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය හා ඒ මත රු. 21,533,040 ක් වූ ආයෝජන මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව ගිණුම්වල විශ්‍රාම ප්‍රතිලාභ සැලසමට සහ පාරිතෝෂිත වගකීම් පිරිවැයට අදාළ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට සිදු කරන ලද සංශෝධන අනුව, පොලී ආදායම හා ලාභාංශ හැරුණු විට කොමිෂන් සභාවේ අනෙකුත් ආදායම්, ආදායම් බදු වලින් නිදහස් කර තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 24 ප්‍රකාරව එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත දැක්වේ.

(අ) බැංකු ගිණුමට සෘජුවම ලැබී තිබුණු සමාලෝචිත වර්ෂයේ විදුලි සංදේශ බදු රු. 11,704,355 ක් සහ ලැබිය යුතු ජාත්‍යන්තර බැහැර ඇමතුම් බදු රු. 31,405,442 ක් ගිණුම්වලින් අත්හැර තිබුණු බැවින් වර්ෂයේ ආදායම රු. 43,109,797 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මුදල් හා මුදල් සමාන ශේෂය සහ ලැබිය යුතු ගිණුම් පිළිවෙලින් රු. 11,704,355 කින් හා රු. 31,405,442 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ගිණුම්වල දැක්වෙන ගොඩනැගිලි පිරිවැය රු. 3,292,300 කින් සාවද්‍යව වැඩියෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිලි සඳහා ක්ෂය රු. 164,615 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) අවස්ථා කිහිපයකදී පොලී ආදායම ගණනය කිරීම සඳහා පොලී ආදායම මත ගෙවිය යුතු රඳවා ගැනීම් බදු සාවද්‍යව ඇතුලත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා පොලී ආදායම හා ගෙවිය යුතු රඳවා ගැනීම් බදු රු. 185,508 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතියට (ICT-RCBP) අදාල වියදම රු. 3,223,683 ක් සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ වියදමක් ලෙස සලකා තිබුණු හෙයින් එම මුදලින් වියදම වැඩියෙන් දක්වා තිබුණි.

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්
-------------------

2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු. 1,948,138,756 ක් විය. මෙයින් වර්ෂ 1 කට වැඩි කාලයක් හිඟ හිට පැවති ශේෂය රු. 318,674,227 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියා මාර්ග ඉතා දුර්වල මට්ටමක පැවතුණි. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂ 1 කට අඩු | වර්ෂ 1 ට වැඩි 02 ට අඩු | වර්ෂ 02 ට වැඩි | එකතුව |
|---|---|---|---|
| රු. | රු. | රු. | රු. |
| 1,629,464,534 | 47,084,657 | 271,589,570 | 1,948,138,756 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) ලැබිය යුතු ගිණුම් ශේෂ වලින් රු. 1,759,562,017 ක් එනම් 90% ක් ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු මත ලැබිය යුතු මුදල් ශේෂ නියෝජනය විය. මෙයින් රු. 105,727,791 ක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් (SLBC) ලැබිය යුතු ශේෂ විය. කෙසේ වුවද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ගිණුම්වලට අනුව 2011 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට ගෙවිය යුතු ශේෂ ලෙසට කිසිවක් නොදැක්වේ. තවද මෙම දිගුකාලීන හිඟ හිටි ශේෂයන් අයකර ගැනීමට හෝ

නිරවුල් කර ගැනීමට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමඟ කිසිදු විධිමත් සාකච්ඡාවක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟ හිට පැවති ලෙස රු. 271,577,267 ක් දක්වා තිබුණද තථ්‍ය හිඟ හිටි කාල පරිච්ඡේදය වර්ෂ 20 කට වැඩි විය. එබැවින් මෙම ශේෂය අයකර ගැනීම සැක සහිතය. තවද, මෙම දිගුකාලීන හිඟ හිට පැවති ශේෂයන් අයකර ගැනීමට කිසිදු ඵලදායි පියවරක් ගෙන නොතිබුණි.

(iii) විගණනයට ඉදිරිපත් කරන ලද ලේඛනයට අනුව, ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු වලට අදාළ ණයගැතියන් සංඛ්‍යාව 917 ක් විය. කොමිෂන් සභාව විසින් ණයගැතියන් 200 දෙනෙකුට සනාථ කිරීමේ ලිපි යවා තිබුණද ණයගැතියන් 23 ක් පමණක් එයට ප්‍රතිචාර දක්වා තිබුණි. මේ අතර කොමිෂන් සභාවේ ගිණුම් පොත්වලට අනුව ණය ගැතියන් දෙදෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂ එකතුව රු. 168,812,935 ක් වුවද සනාථ කිරීම් ලිපිවල මෙම ණයගැතියන් රු. 125,198,775 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 43,614,160 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) අයකරගත යුතු සේවක ණය
-----------------------------

2011 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු සේවක ණය ශේෂ එකතුව රු. 83,725,710 ක් වූ අතර විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්ම වූ හිඟ හිට පැවති ශේෂ රු. 2,420,222 ක් විය. විස්තර පහත දැක්වේ.

| ණය සහ අත්තිකාරම් වර්ගය | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා, හිඟ හිට පැවති මුදල් |
|---|---|---|
| | රු. | රු. |
| ආපදා ණය | 21,198,207 | 983,823 |
| උත්සව අත්තිකාරම් | 137,258 | - |
| මෝටර් වාහන ණය | 55,428,682 | 1,294,405 |
| නිවාස ණය | 5,700,209 | - |
| යතුරු පැදි ණය | 1,261,354 | 141,994 |
| | 83,725,710 | 2,420,222 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයද කරනු ලැබේ.

2010 වර්ෂය තුලදී සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු. 474,275 ක් වූ ආපදා හා යතුරු පැදි ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ගෙවිය යුතු ගිණුම්

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු. 3,255,142,565 ක් වූ අතර වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව හිඟ හිට පැවති ශේෂ රු. 312,059,587 ක් විය.

(ii) 2003 සිට 2008 කාල පරිච්ඡේදය තුල ආයතනය 05 කින් ලැබුණු අත්තිකාරම් රු. 307,635,000 ක් අඛණ්ඩව ජංගම වගකීම් ලෙස ගෙන තිබුණද කොමිෂන් සභාවේ ආදායම ලෙස ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.4 විගණනයට සඳහා සාක්ෂි නොවීම

------------------------------------

සනාථ කිරීම්, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛණය, පරිගණක හා උපාංග වලට අදාළ ලේඛනය, සමීක්ෂන මණ්ඩල වාර්තා සහ මෙහෙයවන්නන් විසින් ගෙවන ලද හා ගෙවිය යුතු බදු හා ගාස්තු මත ස්වාධීන ඇගයීම් වාර්තා නොමැති වීම හේතුවෙන් එකතුව රු. 30,043,711,925 ක් වූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්, ස්ථාවර වත්කම්, ක්ෂය, විදුලි සංදේශ බදු හා ගාස්තු සහ සෙස් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

විගණනයේද නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත පරිදි වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත<br>(i) 13 (8) වගන්තිය. | රාජ්‍ය සංස්ථාවක පාලක මණ්ඩලය විසින් 13(7) (ඒ) වගන්තිය යටතේ වාර්තාව සැලකිල්ලට ගත යුතු අතර එම වාර්තාව සංස්ථාවට ඉදිරිපත් කර මාස තුනක් ඇතුලත එම වාර්තාවෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් ගන්නා ලද පියවර හෝ ගැනීමට අදහස් කරන ක්‍රියා මාර්ග පිළිබඳ දැනුම් දිය යුතුය. එසේ වුවද 2010 වර්ෂයේ වාර්තාව සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 වගන්තිය හා | අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා අදාළ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාව විසින් රු. 3,120,000,000 ක |

| | | |
|---|---|---|
| | 2011 ජනවාරි 27 දිනැති අංක පීඊඩී/56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | මුදලක් බැංකුවක ස්ථාවර තැන්පත් ගිණුමක හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඇතුලත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි (මු.රෙ.) | |
| | (i) මු.රෙ. 371 (ඇ) | තත්කාර්ය අග්‍රිම දීමට පෙර අපේක්ෂිත වියදම තීරණය කිරීමට කොමිෂන් සභාවට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දෙන ලද රු. 1,021,250 ක් වූ අත්තිකාරම් වලින්, රු. 496,664 ක මුදලක් එනම් 49% ක් අදහස් කළ කාරණයන්ට යොදා ගැනීමෙන් තොරව දින 3 සිට 71 ක කාලයක් ප්‍රමාද වීමෙන් පසුව මුදලින් පියවා තිබුණි. |
| | (ii) මු.රෙ. 371 (2) (ආ) | නිශ්චිත සීමාව වන රු. 20,000 ඉක්මවා දෙන ලද තත්කාර්ය අතුරු අග්‍රිම 83 ක එකතුව රු. 4,519,175 ක් විය. |
| | (iii) මු.රෙ. 757 (2) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී සමීක්ෂණ මණ්ඩලයක් පත්කර එහි වාර්තාව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම් වලින් ප්‍රතිඵලය රු. 29,350,461,445 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 5,378,271,498 ක අතිරික්තයක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 23,972,189,947 ක වර්ධනයක් දැක්වුණි.

වර්ෂයේ විදුලි සංදේශ බදු හා ගාස්ත ආදායම රු. මිලියන 23,836 කින් විශාල ලෙස වැඩිවීම හා බොල් හා අඩමාන ණය ප්‍රතිපාදනය රු. මිලියන 138 කින් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

(අ) කොමිෂන් සභාවේ ආදායම් හා වියදම පිළිබඳ සාරාංශයක් පෙර වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තර | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | විචලනය හිතකර/ (අහිතකර) | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2011 දෙසැම්බර් 31 | 2010 දෙසැම්බර් 31 | | |
| | රු. 000 | රු. 000 | රු. 000 | % |
| <u>ආදායම</u> | | | | |
| විදුලි සංදේශ බදු | 28,185,372 | 5,704,938 | 22,480,434 | 394 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 1,774,458 | 418,436 | 1,356,022 | 324 |
| වෙනත් ආදායම | 91,803 | 7,187 | 84,616 | 1177 |
| මුළු ආදායම | 30,051,633 | 6,130,561 | 23,921,072 | 390 |
| <u>වියදම</u> | | | | |
| නියාමන වියදම් | 107,504 | 63,894 | (43,610) | (68) |
| මෙහෙයුම් වියදම් | 593,668 | 688,396 | 94,728 | 14 |
| මුළු වියදම | 701,172 | 752,290 | 51,118 | 7 |
| මූල්‍ය ප්‍රතිඵලයට ශුද්ධ බලපෑම | 29,350,461 | 5,378,271 | 23,972,190 | 446 |

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ කාරක ප්‍රාග්ධනය පෙර වර්ෂය සමග සැසඳීමේදී 165% කින් වැඩි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල එක දිගට අනවශ්‍ය ද්‍රවශීල වත්කම් කොමිෂන් සභාව තබාගෙන තිබූ බව එයින් පෙනී යයි. තවද 2011 දෙසැම්බර් 31 දිනට ද්‍රවශීල අනුපාතය 1.4:1 වූ බවත් එය 2010 දෙසැම්බර් 31 දිනට 1.2:1 වූ බවත් නිරීක්ෂණය විය.

2.3 කාර්ය සාධන සමාලෝචනය
------------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු පළාතේ විදුලි සංදේශ, ගුවන් විදුලි විකාශන හා රූපවාහිනී විකාශන කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් කොමිෂන් සභාව රු. මිලියන 292.3 ක් වැය කරමින් කොකාවිල් හා වවුනියා හි කුළුණු දෙකක් ඉදි කරන ලදී. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුල මෙම ප්‍රාග්ධන වියදම මත කොමිෂන් සභාව කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ආ) 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතට යොමුවන පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, සොරකම් කරන ලද හෝ අස්ථානගත වූ ජංගම දුරකථන සම්බන්ධයෙන් මහජන පැමිණිලි භාරගැනීමට හා ඒ පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමට 2010 අප්‍රේල් සිට බලපැවැත්වෙන පරිදි වැඩ සටහනක් දියත් කරන ලදී. කෙසේ වුවද ඉහත පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීමට විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට නොහැකි වී තිබුණි. පසුගිය වර්ෂ දෙක සඳහා මහජන පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | ලැබී තිබුණු පැමිණිලි සංඛ්‍යාව | දක්වන ලද ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිචාර පිළිබඳ ප්‍රතිශතය |
|---|---|---|---|
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | % |
| 2010 | 5600 | 1200 | 21.4 |
| 2011 | 5400 | 1900 | 35.2 |

මේ සම්බන්ධයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මා වෙත මෙසේ දන්වා තිබුණි. "එවැනි සිදුවීම් ඉහළ යමින් පැවතීම යටතේ කොමිෂන් සභාව මෙම පහසුකම් අඛණ්ඩව කරගෙන යාමේ තත්ත්වයක නොමැත."

(ඇ) 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වගන්තිය යටතේ ඕනෑම විදුලි සංදේශ උපකරණයක් නිෂ්පාදනය, විකිණීම, ආනයනය කිරීම, විකිණීමට ඉදිරිපත් කිරීම, ගනුදෙනු කිරීම, පැවරීම, කුලියට ගැනීම, බදු දීම, ප්‍රදර්ශනය කිරීම, නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම කරන පුද්ගලයෙකු කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා ගත යුතුය. එසේ වුවද, එසේ බලපත්‍ර ලබාගැනීමෙන් තොරව රට තුළ විවිධ ස්ථානයන්හි එවැනි ව්‍යාපාර පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර පවත්වා ගෙන යන ආයතන විමර්ශනය කර සොයා ගැනීමට හා අදාළ ගාස්තු අයකර ගැනීමට කොමිෂන් සභාවට විධිමත් යාන්ත්‍රණයක් හෝ දත්ත පදනමක් නොවූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) ඇතුල්වීමේ ආලින්දය හා ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ වැඩ නිම කිරීමෙන් තොරව අලුත්වැඩියා කිරීම් ලෙස රු. 180,000 ක මුදලක් පසුගිය වර්ෂ 6 ක කාලයක් කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් තිබුණි.

2.4 මෙහෙයුම් සමාලෝචනය
--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, සෑම විදුලි සංදේශ මෙහෙයුම් කරුවකු විසින්ම 2011 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නව "සෙස්" බදු ගෙවිය යුතුය. කොමිෂන් සභාවට සෙස් බදු ගෙවීමට කාල සීමාවක් පනවා නොතිබූ බැවින් මෙහෙයුම් කරුවන් විසින් ඔවුන්ගේ සෙස් බදු කලින් කලට ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට ලැබිය යුතු සෙස් බදු සැලකිය යුතු ප්‍රමාදයකින් පසු ලැබී තිබුණි. පවතින නීති අනුව ප්‍රමාද ගෙවීම් මත අධිභාර පැනවීමට නීතිමය බලතල නොවූ බව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මා වෙත දන්වා තිබුණි.

(ආ) 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22 (උ) වගන්තිය ප්‍රකාරව, සෑම විදුලි සංදේශ මෙහෙයුම්කරුවෙකුම ඔහුගේ බලපත්‍රය සඳහා සෙස් බදු ගෙවිය යුතු අතර, ඔහුට නිශ්චිත වර්ෂයට අදාළව මෙහෙයුම් බලපත්‍ර ගාස්තු ඊළඟ වර්ෂයේ ජනවාරි 31 ට පෙර ගෙවිය යුතුය. කෙසේ වුවද එවැනි ඒකක 13 ක් විසින් ගෙවිය යුතු රු. 206,384,147 ක් වූ සෙස් බදු සහ ඒකක 08 ක් විසින් ගෙවිය යුතු රු. 393,808,974 ක් වූ මෙහෙයුම් ගාස්තු පළිවෙලින් දින 21 සිට 275 දක්වා හා දින 23 සිට 275 දක්වා කාල පරිච්ඡේදයක ප්‍රමාදයකින් පසු ගෙවා තිබුණි. ප්‍රමාදයන් සඳහා අතිරේක ගාස්තුවක් පැනවීමට හැකි බව බලපත්‍රයෙහි සඳහන් කර තිබුණද එය තීරණය කිරීමට හා අතිරේක ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද ප්‍රමාදයන වෙනුවෙන් හෝ මෙහෙයුම් බලපත්‍ර ගාස්තු හා සෙස් නොගෙවීම වෙනුවෙන් අතිරේක ගාස්තුවක් අයකර ගැනීමට පවත්නා පනතේ විධි විධාන නොමැති බවත් නීතිමය බලතල තහවුරු කර ගැනීමට ඉදිරියේදී විදුලි සංදේශ පනතට ක්‍රමවේදයක් ඇතුලත් කිරීමට කටයුතු කරන බවත් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල විසින් 2011 ජුනි 28 දින විගණකාධිපති වෙත වාර්තා කර තිබුණි. කෙසේ වුවද 2012 ජුනි 30 දක්වා කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/29 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව සෑම විදුලි සංදේශ මෙහෙයුම්කරුවකුට ජාත්‍යන්තර ඇමතුම් ගාස්තු බදු ප්‍රකාශිත දිනට හෝ ඊට පෙර ගෙවිය යුතුය. එහෙත් මෙහෙයම්කරුවන් 4 දෙනෙකු විසින් ගෙවිය යුතු එකතුව රු.29,089,578 ක් වූ ජාත්‍යන්තර ඇමතුම් ගාස්තු බදු දින 18 සිට දින 135 ක ප්‍රමාදයකින් පසුව ගෙවා තිබුණි.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

2011 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 265 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 203 ක් පමණක් විය. කෙසේ වුවද අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත් පදනම හා අනියම් පදනම මත සේවකයන් 20 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස ඔවුන්ට රු. 11,777,540 ක මුදලක් ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක මට්ටම | 23 | 08 | 15 | - |
| මාණ්ඩලික මට්ටම | 34 | 20 | 14 | - |
| සහාය සේවක | 166 | 117 | 49 | - |
| කණිෂ්ඨ සේවක | 42 | 38 | 4 | - |
| වෙනත් (කොන්ත්‍රාත් හා අනියම්) | - | 20 | - | 20 |
| | 265 | 203 | 82 | 20 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

විධායක මට්ටමේ පවතින පුරප්පාඩු වලට අදාළ නිලධාරීන් තිදෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළදී රු. 208,725 ක මුදලක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි.

## 2.6 වාහන උපයෝජනය

2011 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට වාහන 36 ක් අයත්ව තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන හා වාහන නඩත්තුව සඳහා රු. 13,464,238 ක මුදලක් වැය කර තිබුණි. පෙර වර්ෂය තුළදී දරන ලද වියදම රු. 12,371,085 ක් පමණක් වූ අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එම 9% ක වැඩිවීමක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් රු. 2,950,000 ක් වටිනාකම වූ වාහන 06 ක් 2010 වර්ෂයේ සිට උපයෝජනය කර නොතිබූ අතර 2012 අප්‍රේල් 02 දින ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමක් මගින් වාහන අපහරණය සඳහා කොමිෂන් සභාව විසින් කටයුතු කර තිබුණි.

(ආ) 2004 හා 2010 වර්ෂ තුළදී වටිනාකම රු. 1,850,000 ක් වූ වාහන දෙකක් අනතුරුවලට භාජනය වී තිබුණද, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 සිට 105 ප්‍රකාර ක්‍රියා මාර්ග ගෙන තිබුණි. තවද කොමිෂන් සභාවේ එක් වාහනයක් පසුගිය වර්ෂ කිහිපයක් උපයෝජනය කර නොතිබුණි. මෙම වාහන අලුත්වැඩියා කිරීමකින් තොරව විනාශවිය හැකි තත්ත්වයකට තබා තිබුණි.

2.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

කදිරාන, මීගමුව ප්‍රදේශවල මුළු ඉඩම්වලින් වටිනාකම රු. 45,000,000 ක් වූ ආසන්න වශයෙන් 50% ක් පමණ වූ බිම් වෙනත් පාර්ශවයන් විසින් අනවසරයෙන් අල්ලාගෙන සිටි අතර, මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. එබැවින් ගිණුම්වල දැක්වෙන රු. 136,475,809 ක් වූ ඉඩම් පිරිවැයෙහි නිරවද්‍යතාවය එක් එක් ඉඩමෙහි නිවැරදි තත්ත්වය හෙළිදරව් කිරීමක් ලෙස සැලකීමට නොහැකි විය.

3. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

3.1 සංයුක්ත සැලැස්ම

-------------------

2007 දෙසැම්බර් 18 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඩී/47 දරන චක්‍රලේඛය ප්‍රකාරව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශයට (ජනාධිපති ලේකම් කාර්යාලයට) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහා භාණ්ඩාගාරයට හා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එසේ කටයුතු කර නොතිබුණි. කොමිෂන් සභවේ පවත්නා යාවත්කාලීන නොකරන ලද සංයුක්ත සැලැස්මට අනුව මානව සම්පත් පරිපාලනය මූල්‍ය හා සැපයුම් අංශයන් සහ ලබාගත හැකි වර්තමාන සම්පත් වැනි වැදගත් අංගයන් ඇතුළත් කිරීම මගින් කළමනාකරණ වගකීම් හඳුනා ගැනීම සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවධානය යොමු කර නොතිබුණි. එසේම ක්‍රියාකාරී සැලැස්මක් සහ ඉකුත් වර්ෂ 03 ක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබණි. තවද, කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර හා අරමුණු ඉටුකර ගැනීම සඳහා උපාය මාර්ග ඉහත සංයුක්ත සැලැස්මේ අන්තර්ගත කර නොතිබුණි.

සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම සඳහා විදේශ සංවිධානයකට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර, එ.ජ.ඩො. 262,980 ක් එනම් රු.මිලියන 22.2 ක පිළිවෙලින් 2000 දෙසැම්බර් 06 දින, 2000 දෙසැම්බර් 26 දින හා 2001 අප්‍රේල් 19 දින වාරික තුනකින් ගෙවා තිබුණි. කෙසේවුවද, 2007 ජූනි 19 දින හා 2011 නොවැම්බර් 15 දින පැවැති රාජ්‍ය ව්‍යවසාය කමිටු රැස්වීම්වලදී කොන්ත්‍රාත්කරු විසින් කොමිෂන් සභාවට දී තිබුණු ලියකියවිලි උසස් තත්ත්වයකින් නොවූ බවත්, එය හුදෙක්ම වෙනත් සංවිධානයක් සඳහා පිළියෙල කර සුළු වෙනස්කම් සිදු කිරීමෙන් පසු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාව සඳහා පිළියෙල කරන ලද වාර්තාවක් පමණක් වූ බවත් එම කමිටුව නිරීක්ෂණය කරන ලදී. එසේවුවද, මේ සම්බන්ධයෙන් 2012 ජූනි 30 දක්වා කොමිෂන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

2011 නොවැම්බර් 15 වන දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඒ අනුව වාර්තාවක් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත නියෝග කරන ලදී.

3.2 ක්‍රියාකාර සැලැස්ම

--------------------

ඉටුකර ගත යුතු ඉලක්ක සමඟ ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් පැහැදිලිව හඳුනාගත හැකි වන පරිදි සහ කාල පරිච්ඡේදය තුළ සිදුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් අයවැයගත ප්‍රතිපාදනය දැක්වෙන ක්‍රියාකාර සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් පිළියෙල කර නොතිබුණි. එබැවින් සකස් කරන ලද ඉලක්ක ඉටුකර ගැනීමේ අරමුණින් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීමට හා අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට සමස්ථයක් වශයෙන් කොමිෂන් සභාවේ ප්‍රගතිය ඇගයීමට නොහැකි විය.

3.3 අභ්‍යන්තර විගණනය

----------------------

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ නිලධාරීන් තිදෙනෙකුගෙන් අභ්‍යන්තර විගණන ඒකකය සමන්විත විය. සමාලෝචිත වර්ෂය සඳහා අතුරු අභ්‍යන්තර විගණන වාර්තා හා අභ්‍යන්තර විගණන සැලැස්ම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබුණි.

3.4 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.5 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල වූ විෂයයන් 24 ක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැයගත මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මුදල් අයවැය, පෙර වර්ෂය අවසානයට පැවති තථ්‍ය මුදල් ශේෂය ගෙන සකස් කරනු වෙනුවට පෙර වර්ෂය අවසානයට අයවැයගත මුදල් ශේෂය පදනම් කර ගෙන සකස් කර තිබුණි. එබැවින් වර්ෂය මුළුල්ලේ තථ්‍ය හා අයවැයගත මුදල් ශේෂයන්හි අවම වශයෙන් රු.1,000,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

4. පද්ධත හා පාලන
---------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිෂන් සභාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අතිරික්ත මුදල් ආයෝජනය

(ආ) ණයගැතියන්

(ඇ) විදුලි සංදේශ බදු හා ගාස්තු රැස් කිරීම

(ඈ) වාහන උපයෝජනය

(ඉ) අස්ථානගත වූ හෝ සොරකම් කළ ජංගම දුරකථන පිළිබඳ විමර්ශන